# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,487 — 1965 අගෝස්තු 20 වැනි සිකුරාදා — 1965.8.20**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 96/50.

### හඟුරන්කෙත ඇසළ පෙරහැර

**නිවේදනය**

1951 අප්‍රේල් 6 වැනි දින අංක 10,232 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද හඟුරන්කෙත ඇසළ පෙරහැරට අදාළ වන්දනා නියෝග පිළිබඳ වූ නියෝග වල 1 වැනි සහ 2 වැනි නියෝගවලින් මට පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති විජයානන්ද දහනායක වන මම, මෙම නිවේදනයෙන්—

(1) ඉහත කී නියෝගවල 1 වැනි නියෝගය යටතේ 1965 වර්ෂය තුළ ඉහත කී නියෝග බල පවත්වන කාලය, 1965 අගෝස්තු මස 27 දින සිට 1965 සැප්තැම්බර් මස 11 දින දක්වා අවසන් වන කාලය බව නියම කරමි.

(2) තවද ඉහත කී නියෝගවල 2 වැනි නියෝගය යටතේ පහත දක්වෙන උපලේඛනයෙහි නියමිත ප්‍රදේශය, 1965 වර්ෂය තුළදී මේ නියෝග අදාළ කිරීම පිණිස කඳවුරු ප්‍රදේශය විය යුතු ලෙස නියම කරමි.

වි. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමැති.

1965 අගෝස්තු 17 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

**කඳවුරු ප්‍රදේශය**

පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි, උඩහේවාහැට කොට්ඨාශයේ දියතිලක කෝරලයේ හඟුරන්කෙත ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් හඟුරන්කෙත පිහිටා ඇති සියලුම භූමි ප්‍රදේශය :—

උතුරට : පිලපිටිය කඳුර සිට මහනුවර-රාගල ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට වැටෙන අඩි පාර, මහනුවර-රාගල ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පාර සහ ආර්. ඊ. ඇස්. ද සොයිසා මහතාගේ ඉඩමේ උතුරු මායිම;

දකුණට : පැට්රෝල් ගබඩාවේ සිට ලංකා දුම්කොළ සමාගමේ භූමියට වැටෙන පාර සහ ලංකා දුම්කොළ සමාගමේ භූමියේ සිට බොරහින්න පාරට වැටෙන අඩි පාර ;

නැගෙනහිරට : එළමල් වැව කඳුර ;

බස්නාහිරට : පැල්-ළිඳ පොල්වත්තේ නැගෙනහිර මායිම, කුඹුරේ ගෙදර වත්තේ නැගෙනහිර මායිම, නවන්එළිය කුඹුරේ නැගෙනහිර මායිම, පිලපිටිය කුඹුරේ නැගෙනහිර මායිම, වැව්ලියද්ද කුඹුරේ නැගෙනහිර මායිම සහ බෝදන්ඩරාවේ කුඹුරේ නැගෙනහිර මායිම.

8–868

---

### 1961 අංක 28 දරණ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පණත

1 963 අංක 5 දරණ පනතින් සංශෝධිත, 1961 අංක 28 දරණ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 37 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනසතු සේවා ඇමති විතාන ආරච්චිගේ සුගතදාස වන මම, එකී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වන වගන්තිය යටතේ පනවනු ලැබ 19 64 ජනවාරි 9 වන දින අංක 13,910 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද (අංක 74 දරණ) පැවරීමේ ආඥාව—

(අ) ඒ ආඥාවට යාකොට ඇති උපලේඛනයේ 70 වැනි අංකයෙහි විස්තර කරනු ලැබුවා වූද මීට යාකොට ඇති උපලේඛනයෙහි වඩාත් සම්පූර්ණව විස්තර කරනු ලැබුවා වූද දේපළවලට ; හා,

(ආ) ඉහත කී දේපළවල තිබෙන සියලුම ගොඩනැගිලිවලට ;

අදාළවන ප්‍රමාණයට, මේ ආඥාවෙන් අවලංගු කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා ඇමති.

1965 අගෝස්තු මස 17 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයෙහි දෙහිගම්පල් කෝරළේ රුවන්වැල්ලේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු හා මට්ටම් ශිල්පී වන එස්. එච්. ප්‍රනාන්දු විසින් සම්පාදනය කරන ලද 1955 ජූලි 30 දින අංක 463 දරණ පිඹුරේ අංක 1, 2, 3 සහ 4 දරන්නාවූ ද, උතුරට ඒ ඉඩමේ ම කොටසකින් ද, නැගෙනහිරට කෑගල්ලේ සිට අවිස්සාවේල්ල දක්වා වැටී ඇති පාරෙන් ද, දකුණට (දැනට කැපැල් කන්තෝරුව පිහිටා තිබෙන භූමිය වූ) ඒ ඉඩමේ ම කොටසින් ද, බස්නාහිරට ඒ ඉඩමේ ම කොටසකින් ද මායිම් වූ ප්‍රමාණයෙන් එකී අංක 463 දරණ පිඹුර අනුව අක්කර නැත, රූඩ් නැත, පර්චස් විසිතුනයි දශම දෙකයි අටක් (අ.0 රූ. 0 පර්. 23.28) වූ ද ඒ බිම් කැබලිවලින් සමන්විත සම්පූර්ණ බිම් කොටස.

(ඇල්ජී/සී/241) (කැල්ටැක්ස්—රුවන්වැල්ල).

8–869

---


ලංකාවේ වැලව්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1251 ——ආර් 8288—6,510 (65/8)